# චීන විද්‍යාර්ථීන්ට සිංහල භාෂාව ඉගැන්වීමේදී මතුවන ගැටලු

*උත්පලා කුමාරි, ජේ. එම්.* [1]

ලොව ඕනෑම පුද්ගලයෙකුට යම්කිසි මව්බසක් හිමිය. එය, ඔහුගේ හෝ ඇයගේ උපත සමගාමීව හිමි වන දෙයකි. භාෂාව ජාතියක අනන්‍යතාව හඟවන සංකේතයයි. භාෂාව මානව සංස්කෘතියේ පදනම වශයෙන් ගත යුතු සංස්ථාවකි. එය මනුෂ්‍යයන් විසින් එකමුතුව සාමූහික ප්‍රයත්නයෙන් නිපදවා ගන්නා ලද විශිෂ්ට නිර්මාණයක් වන්නේය. භාෂාවක් යනු ජීවවිද්‍යාත්මක වශයෙන් උපතේ සිට යම් පුද්ගලයෙකු සංජානනය කරගනු ලබන හැකියාවකි. මෙහිදී ඒ ඒ පුද්ගලයාගේ මව් භාෂාව උපතේ සිට ශ්‍රවණයෙන්ද, සංස්කෘතිය සම්ප්‍රේෂණයෙන්ද, සමාජානුයෝජනයෙන්ද ක්‍රමිකව ඔහු සමඟ වැඩේ. අමතර භාෂා ශක්‍යතා ඉගෙනුම් කාර්යයක් වශයෙන් පුද්ගලයකුට වර්ධනය කළ හැකිය.

සන්නිවේදනය, ඥාන වර්ධනය හා විනෝදාස්වාදය ලබා ගැනීම මානව භාෂාවේ අරමුණු ලෙස සරලව හඳුනාගත හැකිය. මානව භාෂාව සහජයෙන්ම ලැබෙන්නක් වුවද කතා කිරීමේ ශක්තිය කවර භාෂාවක් උදෙසා යොදා ගන්නේද යන්න භාෂක සමාජය අනුව තීරණය වේ. ගෝලීයකරණය සමග රටවල් අතර සබඳතා ගොඩනැගීම සඳහා වෙනත් භාෂාවන් ඉගෙනීම කෙරෙහි ලොව උගතුන්ගේ අවධානය යොමු විය. නූතන භාෂා අධ්‍යයනය වර්තමානය වන විට ලංකාවේද ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයක් බවට පත්ව ඇත.

චීන **වි**ද්‍යාර්ථීන්ට සිංහල භාෂාව ඉගැන්වීමේදී මතුවන ගැටලු කිහිපයක් හඳුනාගත හැකිය. එහිදී භාෂාව, ව්‍යාකරණය හා සංස්කෘතිය යන අංශ කෙරෙහි එම ගැටලු බහුලව බලපා තිබෙන බව හඳුනාගත හැකිය. සිංහල භාෂාව අධ්‍යයනය කරන්නා වූ විදේශීය **වි**ද්‍යාර්ථීන්ට මතුවන පොදු ගැටලු කිහිපයක්ද අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු වේ. සිංහල භාෂාව හදාරන විදේශීය සිසුන් මුහුණපාන පොදු ගැටලුවක් වන්නේ, සිංහල සංස්කෘතිය සහ භාෂාව අතර පවතින සම්බන්ධතාවෙහි ස්වරූපය හඳුනාගැනීමට පවතින දුෂ්කරතාවයි**.** භාෂාවෙහි වදන්වල ඇති අර්ථය මනාව වටහා ගැනීම සඳහා තදනුබද්ධ සංස්කෘතික අර්ථයද වටහා ගැනීම **අවශ්‍ය** වීම ඊට හේතුවයි. භාෂාවක් යනු කිසියම් ප්‍රජාවක සාමාජිකයන්ද, සංස්කෘතියක කොටස්කරුවන්ද වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම්

හා සන්නිවේදනය සඳහා යොදා ගන්නා සම්මුතික වූ වාක් සංකේත පද්ධතියකි. භාෂාවේ ස්වරූපය හඳුනා ගැනීමේදී ප්‍රාදේශීය උපභාෂා සහ සමාජීය උපභාෂා වැනි ධාරාවන් කෙරෙහිද ඥානනය වීම අවශ්‍යය. මෙම ධාරාවන් මගින් භාෂාවකට විවිධත්වයක් මෙන්ම විචිත්‍රත්වයක් ද ප්‍රවිෂ්ට වේ. සිංහල භාෂාව නිර්මාණශීලී භාෂාවකි. විවිධ අවස්ථා සමග බද්ධව පවත්නා ප්‍රාස්තාවික යෙදුම් මගින් එකී නිර්මාණශීලීභාවය ඔප්නැංවුණද එබඳු භාෂා ස්වරූප යොදා ගැනීමේ ශක්‍යතාව හිමිවන්නේ භාෂාව පරිශීලනය කිරීමෙන් ලබාගන්නා අත්දැකීමෙනි. එමෙන්ම සිංහල භාෂාව හැදෑරීමේදී චීන විද්‍යාර්ථීන්ට මතුවන ගැටලු කීපයක්ද හඳුනාගත හැකිය. සිංහල භාෂාවේ ඇතුළත් ලේඛන වයවහාරය අතර සහ කථන ව්‍යවහාරය අතර පවතින පරස්පර විරෝධීතාව හඳුනා ගැනීමේ දුෂ්කරතාව සම්බන්දයෙන් චීන විද්‍යාර්ථීන්ට මතුවන ගැටලුද මෙම අධ්‍යයනයෙන් සාකච්ඡාවට ලක්වේ. ශබ්දකෝෂ අර්ථ භාවිතයේදී මතුවන ගැටලු, අක්ෂර වින්‍යාසය ගැටලු, උච්චාරණ ගැටලු සහ පද බෙදීමේ ගැටලු යනාදියද අධ්‍යයනයට ලක් වේ.

ඉගැන්වීම් ක්‍රමවේදය මෙන්ම යොදා ගන්නා විෂය දැනුමද විදේශීය විද්‍යාර්ථීන්ට අනුව සකස් විය යුතුය. මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කරගනු ලැබුවේ ක්ෂේත්‍ර අධ්‍යයනය මගිනි. ඒ සඳහා දැනට සිංහල විෂය හදාරන චීන විද්‍යාර්ථීන්ටගේ ලේඛන සහ අදහස්ද යොදා ගැනිණ. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ චීන විද්‍යාර්ථීන්ට සිංහල භාෂාව ඉගැන්වීමේදී මතුවන ගැටලු මොනවාද? යන්නයි. පර්යේෂණයේ අරමුණු වන්නේ එම ගැටලු මගහරවා ගනිමින් විදේශීය සිසුන්ගේ සුබාවබෝධය සඳහා සිංහල විෂය ඉගැන්වීමේ ක්‍රමවේදයත් ප්‍රතිසංස්කරණය විය යුතු ආකාරය හඳුනා ගැනීමයි. මෙම පර්යේෂණයෙහි ප්‍රතිඵල චීන විද්‍යාර්ථීන්ගේ ගැටලු උදෙසා පමණක් නොව සිංහල භාෂාව උගැන්මට ඇල්මක් දක්වන සෙසු විදේශීය විද්‍යාර්ථීන්ගේ ගැටලු උදෙසාද විසඳුම් සෙවීමේ කාර්යය සඳහා යොදා ගැනීමේ හැකියාව පවතී. ඒ අනුව අනාගතයේ විදේශීය විද්‍යාර්ථීන්ට සිංහල භාෂාව ඉගැන්වීම සඳහා මෙම පර්යේෂණයෙන් ලබාගන්නා දැනුම උපකාරී වනු ඇත.

**ප්‍රමුඛ පද** ඃ චීන විද්‍යාර්ථීහු, සිංහල භාෂාව, ඉගැන්වීමේදී මතුවන ගැටලු

[1]*University of Colombo, Sri Lanka. madarajayarathna777@gmail.com*